# මහින්ද රාජපක්ෂ විද්‍යාලයය - හෝමාගම.

## අවසාන වාර පරීක්ෂණය - 2011

## බුද්ධ ධර්මය

**6 ශ්‍රේණිය** **කාලය - පැය 02 යි**

නම/විභාග අංකය :.......................................................................................................................

### 1 පත්‍රය

නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01) නව අරහාදි බුදු ගුණ අතුරින් බුදුරජාණන් වහන්සේ බ්‍රහ්ම, අසුර , යක්ෂ ආදීන් දමනය කර ශාන්තිය ලබා දුන් බව දැක්වෙන බුදු ගුණය වන්නේ,

I සම්මා සම්බුද්ධ II විජ්ජා චරණ සම්පන්න
III පුරිස ධම්ම සාරථි IV සත්ථා දේව මනුස්සානං

02) වචනයෙන් සිදුවන අකුසලයකි,

I ප්‍රිය වචන කීම II මෘදු වචන කීම
III කාරුණික වචන කීම IV සම්පප්‍රලාප කීම

03) බුදුරජාණන් වහන්සේ වනරෝප සූත්‍රයේ දේශනා කර ඇති පින් වැඩෙන ක්‍රියාවක් නොවේ.

I ගෙවතු හා උයන් ඉදි කිරීම II කැලෑ ඉදි කිරීම
III ඒදඬු පාලම් තැනවීම IV ළිං පොකුණු වසා දැමීම.

04) සිදුහත් තාපසතුමා නේවසඤ්ඤානාසඤ්ඤායතනය උපදවා ගත්තේ .............................තවුසා වෙතිනි.

I සර්වමිත්‍ර II භාර්ගව III ආළාර කාළාම IV උද්දකරාමපුත්ත.

05) පෙර ආත්මභාවයන් දැක ගැනීමේ නුවණ,

I පුබ්බේ නිවානුස්සති ඤාණයයි II චුතුපපාත ඤාණයයි
III ආසවක්ඛය ඤාණයයි IV ඍද්ධිවිධ ඤාණයයි.

06) ලක්දිව භික්ෂුණී ශාසනය ආරම්භ වූයේ,

I විහාරමහ දේවියගෙනි II අනුලා දේවියගෙනි
III මල්ලිකා දේවියගෙනි IV සෝමා දේවියගෙනි

MRC IT UNIT

07) කුසල මූලයකි,

I ලෝභ II ද්වේශ III අදෝස IV මෝහ

08) ප්‍රථම ශ්‍රී ලාංකික මහ රහතන් වහන්සේ.................................ය.

I අසිත හිමි II අරිට්ඨ හිමි III අනුරුද්ධ හිමි IV කාශ්‍යප හිමි

09) ආනන්තරීය පාපකර්මයකි.

I සතුන් මැරීම II මව මැරීම III සොරකම් කිරීම IV මත් ද්‍රව්‍ය භාවිතා කිරීම

10) ශ්‍රද්ධාවන්තයාගේ ලක්ෂණයකි,

I පන්සල් යාමට ඇති කැමැත්ත II වන්දනාවේ යාමට ඇති කැමැත්ත

III සුදු ඇඳුම් ඇඳීමට ඇති කැමැත්ත IV දහම් ඇසීමට ඇති කැමැත්ත

11) බුදුන් වහන්සේ සදිශා නමස්කාරය පිළිබඳව පැහැදිලි කොට දුන්නේ කවුරුන් හටද?

I උපාලි ගෘහපති II ආනන්ද හිමි III මිහිඳු හිමි IV සිඟාල ගෘහපති

12) බුදුන් වහන්සේ සම්මා සම්බුද්ධ ලෙස හඳුන්වන්නේ ඇයි ?

I රහසින් වත් පවු නොකළ නිසා II සියලු කෙලෙස් දුරු කළ නිසා

III පුද පූජාවන්ට සුදුසු නිසා IV තුන් කාලය පිළිබඳ දත යුතු සියල්ල මැනවින් දත් නිසා

13) වැඩි තණ්හාවට ගොස් තිබූ දේත් නැති කර ගත් බව දැක්වෙන ජාතක කථාව,

I අත්ථස්සද්වාර ජාතකය II සත්තිකුම්භ ජාතකය

III ස්වර්ණ හංස ජාතකය IV වණ්ණුපථ ජාතකය

14) බුදු වීම සඳහා පිටදීමට නා වෘක්ෂය තෝරා ගත් අතීතයේ පහළව සිටි බුදුවරයෙකි,

I ගෞතම බුදු හිමි II මංගල බුදු හිමි III කකුසඳ බුදු හිමි IV කෝණාගම බුදු හිමි

15) වෛරයෙන් වෛරය කිසි කළෙකත් නොසංසිඳෙන බව දැක්වෙන ධම්ම පද ගාථාව වන්නේ,

I අක්කොච්ඡිමං අවධි මං II නහි වේරේන වේරානි

III යස්ස පාපං කතං කම්මං IV දස්සන කාමෝ සීලවතං

16) ධම්ම පදයේ ගාථා,

I 400 කි II 403 කි III 423 කි IV 433 කි.

17) මම නිදුක් වෙම්මා, නිරෝගි වෙම්මා ............................ආදී වශයෙන් කරන භාවනාව,

I බුද්ධානුස්සති භාවනාවයි II මෛත්‍රී භාවනාවයි

III ආනාපානසති භාවනාවයි IV විදර්ශනා භාවනාවයි.

MRC IT UNIT

18) කාමය,අරතිය,බඩගින්න.........................ආදී වශයෙන් මාර සේනාව,

I 7 කි. II 10 කි. III 30 කි. IV 100 කි.

19) සතර සංග්‍රහ වස්තු වලින් එකකි,

I සමානාත්මතාව II කරුණාව III මුදිතාව IV උපේක්ෂාව

20) කාලයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට ඔබ කළ යුතු වඩාත් නිවැරදි ක්‍රියාමාර්ගය මින් කුමක්ද ?

I හිමිදිරි උදෑසන අවදි වීම II බොහෝ රෑ වී නින්දට යාම.

III කම්මැලි නොවීම IV කාල සටහනකට අනුව වැඩ කිරීම

## II පත්‍රය

**පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

**(01 )** I මිහිඳු හිමියන් ශ්‍රී ලංකාවේදී දේශනා කළ මුල්ම සූත්‍රය කුමක්ද ?

II උඳුවප් පොහොය ශ්‍රී ලංකික කාන්තා පරපුරට වැදගත් වන්නේ ඇයි ?

III ශ්‍රද්ධාවන්තයෙකු තුළ දක්නට ලැබෙන ලක්ෂණ 2 ක් ලියන්න.

IV මිහිඳු හිමියන් සමඟ ලක්දිවට පැමිණි පිරිස නම් කරන්න.

V ත්‍රිලක්ෂණ නම් කරන්න.

VI ජාතික කොඩියේ සිව් කොනෙහි ඇඳ ඇති බෝ කොළ සතරින් නිරූපණය වන්නේ කුමක්ද ?

VII පරිසරය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කළ හැකි ආදර්ශ පාඨ 2 ක් ලියන්න.

VIII පාසල වෙනුවෙන් ඔබ ඉටු කරන යුතුකම් 2 ක් ලියන්න.

( ලකුණු 2×8=16 )

**(02))** I ශීලය යනු කුමක්ද?

II පන්සිල් අනුපිළිවෙලින් ලියන්න.

III පන්සිල් වල නැති අටසිල්වල තිබෙන සිල්පද මොනවාද?

MRC IT UNIT

(03) I තුන්දොර නම් කරන්න.

II සිත සංවර කර ගැනීම සඳහා ඔබ කරන භාවනා ක්‍රම 3 ක් ලියන්න.

III භාවනාවේ යෙදීම පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් ඔබට ප්‍රයෝජනවත් වන ආකාර (5 ක්) ලියන්න.

(04) I පහත වචන වල අරුත පහදන්න.

සන්තුස්සකෝ ........................................... සුභරෝ...............................................

II ඔබ දෙමාපියන්ට බරක් නොවන දරුවකු වීමට ඔබ තුළ ඇති කර ගත යුතු ගුණාංග 4 ක් ලියන්න.

III සිඟාලෝවාද සූත්‍රයට අනුව දරුවන් ගෙන් දෙමාපියන්ට ඉටු විය යුතු යුතුකම් මෙනවාද?

(05) I මිහිඳු හිමියන් ලක්දිවට වැඩම කරන විට මෙහි සිටි රජතුමා කවුද ?

II මහින්දාගමනය නිසා ශ්‍රී ලාංකිකයන්ට ලැබුණු දායාද 4 ක් ලියන්න.

III සංඝමිත්තා රහත් මෙහෙණින් වහන්සේගේ ලංකාගමනය කෙටියෙන් පහදන්න.

(06) I යස්ස පාපං කතං කම්මං...................... ගාථාව සම්පූර්ණ කරන්න.

II එහි තේරුම ලියන්න.

III අංගුලිමාල තෙරුන් වහන්සේගේ කථාව කෙටියෙන් ලියන්න.

(07) I තනතුරට ගැලපෙන සේ හැසිරීම සකස් කරගෙන, සිටු තනතුරක් ලබා ගත් පුද්ගලයා කවුද?

II හොඳ නායකයෙකු තුළ තිබිය යුතු ලක්ෂණ 4 ක් ලියන්න.

III සුදුසු පරිදි ආමන්ත්‍රණය කිරීම හොඳ නායකයෙකුගේ ලක්ෂණයකි. උදාහරණ දෙමින් මෙම කියමන පහදන්න.

MRC IT UNIT